# අනතුරුදායක අවස්ථා හමුවේ ආගම සඟවාගෙන ක්‍රියා කිරීම පිළිබඳ පානම සාක්ෂිය: විමර්ශනාත්මක අධ්‍යයනයක්

අමරසිරි වික්‍රමරත්න[1]

**හැඳින්වීම**

පානම ග්‍රාමය ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රිකයේ නැගෙනහිර වෙරළ තීරයේ දකුණු දිසාවට වන්නට පිහිටි හුදෙකලා ගමකි. නැගෙනහිර දිසාවෙන් මුහුදින් ද බටහිර දෙසින් ලාහුගල ජාතික වනෝද්‍යානයෙන් ද දකුණු දිසාවෙන් කුමන ජාතික වනෝද්‍යානය ද  උතුරු දිසාවෙන් පොතුවිල් සහ සංගමන් කන්දෙන් ද සීමා වී තිබේ. පානම ගමෙන් පිට වන්නේ නම් පොතුවිල් නගරයට පැමිණ අක්කරපත්තුව දෙසට හෝ සියඹලාණ්ඩුව දෙසට දිවෙන මාර්ගය භාවිත කළ යුතු ය.

පානමවාසී ජනතාව උරුමයෙන් ගෙනා සංස්කෘතිය සජීවීව පවත්වා ගැනීමට අවකාශයක් හිමි ව නැත. පානම සිංහල ජනතාවගේ ආගම ඇතුළත් සංස්කෘතිය දෙමළ සංස්කෘතිය තුළ ගිලී  නිලීන වීම කෙරෙහි බල පෑ සාධකය මතු කොට ගැනීම වැදගත් ය. පානම ජනාවාස කළෝ උඩරට කැරැල්ලට සම්බන්ධ ව ඉන් පීඩාවට පත්ව ඉන් පලා ආ සිංහලයෝ වූහ. නව ජනපදයේ ස්වකීය ආගම තහවුරු කරනවා වෙනුවට අසල්වැසි ජනතාවගේ සංස්කෘතියේ හැඩය අනුව යමින් හෙළිදරව් නො වී ආරක්ෂිත ව ජීවත් වීමට පෙළඹී තිබේ. පානමට විතැන් වී අභිනවයෙන් හැඩ ගැසෙන විට බුද්ධාගම හා එහි විශ්වාස පද්ධති වෙනුවට ආශ්‍රිත සංස්කෘතියට බරවීම නිසා පත්තිනි ඇදහිල්ල එකතු විය. අසල්වැසි දෙමළ ජනයා අදහන 'අම්මන්' නම් කාන්තා දේව පංතිය අතර 'කණ්ණගි' යනුවෙන් පත්තිනි සඳහන් වේ. සිංහලයන් අතර කියවීමට අනුව පත්තිනි මතු බුදුබව අපේක්ෂා කරන්න බවට වන විශ්වාසය යම් සහනශීලීත්වයක් ළඟා කරන්නට ඇත. දෙමළ සංස්කෘතියෙන් පත්තිනි ඇදහිල්ල ගැනීම හේතු කොට ගෙන ජනවර්ග දෙක අතර ඒකාබද්ධතාව තහවුර වී තිබේ. බාහිර ස්වභාවය කෙසේ වුව ද පානම පත්තිනි ඇදහිල්ලේ ප්‍රමුඛාඞ්ගය වන අංකෙළියේ සෑම ක්‍රියාකාරකමක දී ම බුදුන් මුදුන් පත් වේ.

**පර්යේෂණ අරමුණු**

ආරක්ෂාව ප්‍රමුඛ වන අවස්ථා හමුවේ ආගම හෙළිදරව් නො කොට සඟවා ගෙන සිටිය ද එහි අභිලාෂය සහමුලින් බැහර නො වන අතර, සංශ්ලේෂිත උප සංස්කෘතියෙන් එය අමූර්තනය (Abstraction) කොට විමසීම අරමුණු කෙරේ.

[1]. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයය. ඔලුවිල්. *amarasiriw@gmail.com*

**පර්යේෂණ ක්‍රමවේදය**

**1. ප්‍රාථමික දත්ත රැස්කිරීම**

ප්‍රාථමික දත්ත යටතේ පානම පත්තිත් ඇදහිල්ල, අංකෙළිය, බුද්ධ ඇදහිල්ල, පන්සලේ ආරම්භය හා යළි බුද්ධාගම ප්‍රමුඛ වීම යන කාරණාවන් පිළිබඳ වූ දත්ත අදාළ භූමියෙන් ම ලබා ගැනීම සිදු කෙරුණි.

**1.1 සහභාගීත්ව නිරීක්ෂණ**

පානම ප්‍රදේශයේ පවතින උප සංස්කෘතියේ අවයව සහභාගීත්ව නිරීක්ෂණයට ලක් කරනු ලැබිණ.

**1.2 සම්මුඛ සාකච්ඡා**

සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතයෙන් පානම ගැමියන්ගේ අත්දැකීම් ඍජු ව ලබාගනු ලැබිණ.

**2. ද්විතීයික දත්ත රැස්කිරීම**

**2.1 ප්‍රකාශයට පත් කරන ලද මුද්‍රිත හා අමුද්‍රිත ලිපිලේඛන පරිහරණය කිරීම**

**2.1 තෝරා ගන්නා ලද ප්‍රදේශ තුළ කරනු ලැබූ මානවවංශ විද්‍යාත්මක මූලාශ්‍රය තුළින් දත්ත රැස්කිරීම**

**පර්යේෂණ ගැටලුව**

ආගම හෙළිදරව් නො කොට සඟවා ගෙන සිටිය ද එහි නො නැසී පවතින මූලයන් කාලය හා අවකාශය ප්‍රශස්ත වූ කල්හි ප්‍රමුඛ ලක්ෂණයක් ලෙස ඉස්මතු වන්නේ ද? යන්න විමර්ශනය කිරීම යි.

**පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය**

පානම දී පත්තිනි ඇදහිල්ල ප්‍රධාන වන අතර, ඒ හා බැඳී පැවත එන අංකෙළිය බැහැර නො හැකි ලෙස ඒකාබද්ධ වී තිබේ. බුදුබව පතන පත්තිනි දේවියගේ කතා ප්‍රවෘත්තිය සිංහල දෙමළ සහ ඉංග්‍රීසි භාෂා භාෂාත්‍රයෙන් ම ලේඛනගත ව තිබේ. පත්තිනි පුරාවෘත්තයේ විවිධ අංශයන් පිළිබඳ විශ්ලේෂණාත්මක සහ සාමාන්‍ය විමර්ශනය ලෙස මේවායෙහි අන්තර්ගත ව තිබේ. බෞද්ධ සඞ්කල්පය විවිධ ස්වරූපවලින් මේවායෙහි නිරූපිත ය. පානම බුද්ධාගම නො අදහා සිටි සමයේ ඍජු පත්තිනි ඇදහිල්ලේ සහ එහි දිගුවක් වන අංකෙළියේ බෞද්ධ මුහුණුවර තිබේ. **වයන්තිමාලය** පාලඟ සහ මාධවිය නැමැති නළඟන ප්‍රධාන කොට ගෙන රචනා කොට ඇත. සිලප්පතිකාරම් පත්තිනි කතාවේ මූලාශ්‍රය ග්‍රන්ථය වන දෙමළ කෘතියේ නාමය යි. සිලප්පතිකාරම් කෘතියේ සිංහල අනුවාදය **පත්තිනි දෙය්යෝ** නමින් හමු වේ. **සොකරි කතාව හෙවත් ගුරු හටනය** නම් පද්‍යකාව්‍යයේ පත්තිනි ඇදහිල්ල ඉස්මතු වේ. **පාලඟ සැහැල්ලේ** පත්තිනි - පාලඟ ප්‍රවෘත්තිය ප්‍රකාශිත ය. **සලඹ සාන්තිය** පත්තිනි දේවියගේ පිහිට පතා කළ යාග කවි ඇතුළත් පොතකි. නූර් යාල්මාන් විසින් ප්‍රකාශයට පත් කරන ලද ***Under the Bo Tree*** හි දී පානම පිළිබඳ සාකච්ඡා කොට තිබේ. එහි 14වන පරිච්ඡේදය පානම ජනකොටස් දෙකක් මිශ්‍රණය හෙවත් සඞ්කර වීම *(Miscegenation)*, ඥාතිත්වය, කුලය, ආගම ආදිය ලුහුඬින් විස්තර කොට තිබෙන අතර, පානම බෞද්ධ විහාරස්ථානයක් ආරම්භ කළ කාලය සඳහන් ව තිබීම වැදගත් වේ. පත්තිනි දෙවියන්ගේ

ජීවිතකතාව හා පත්තිනි පිදීම ලංකාවට පැමිණි ආකාරය පිළිබඳ විස්තර ඇතුළත් **පන්තිස් කොල්මුර කවි** බැහැර කළ නො හැකි ය. පත්තිනිගේ උපත් කතාව **අඹ විදමනට** ඇතුළත් ය. පත්තිනි ඇදහිල්ල සම්බන්ධ පෘථුල ශාස්ත්‍රීය පර්යේෂණය ගනනාථ ඔබේසේකරගේ ***The Cult of the Goddess Pattini*** කෘතිය යි. පත්තිනි හා සම්බන්ධ පුදපූජා හා දේවාලවල ව්‍යාප්තිය පිළිබඳ විශිෂ්ට කරුණු රාශියක් මෙම කෘතියේ අන්තර්ගත වේ. **ජේ. පී මාපා විසින් ලක්දිව අංකෙළිය** කුඩා පොත් පිංචකි. **ගුණසේකර ගුණසෝමගේ අංකෙළිය-පානම්පත්තුව ඇසුරෙන්** මෙම අධ්‍යයනයට සෘජු ව සම්බන්ධ වන්නකි. 1933 වසරේ උපන් **එස්. කේ කිරිබණ්ඩාර පානම්පත්තුවේ දේව ඇදහිල්ල** පළ කොට තිබේ. පැරණි ම ලේඛනයක් වන **පත්තිනිහෑල්ල** ද මේ අතර ප්‍රමුඛ වේ. කවි 216කින් යුත **පාඬිනළුව** පාලඟ මරා දැමීම නිසා පත්තිනි කළ ශාපයත් ඉන් පඬි රටට ඇති වූ විපතත් මෙහි සඳහන් ය.

**පර්යේෂණ අනාවරණ**

ලංකාව බෞද්ධ රටක් ලෙස හැඩ ගැසෙන අතරවාරයේ දේව සංකල්පය ද තහවුරු වූ බව පෙනේ. දෙවියන්ගේ ආශ්චර්යජනක දේ නිසා දෙවියන් පිළිබඳ ප්‍රවෘත්ති නිසා මිනිසුන් ඒ වෙත ආකර්ෂණය වන්නට විය. බෞද්ධ ඉගැන්වීම්වල ද ආශ්චර්යමත් දේ තිබීම හේතු කොටගෙන දෙවියෝ ද බුදුන් මෙනැයි සිතීමට පෙළඹීම ස්වාභාවික ය. සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය ගැන සඳහන් කරන කල්හි ජනප්‍රිය සුදු ඇත් පැටවාගේ කතාව, සිද්ධාර්ථ කුමාරයා වප්මඟුල දා අහසේ පලක් බැඳගෙන සිටීම ඇතුළු ආශ්චර්යජනක සිද්ධි බෞද්ධ ජනයාගේ විශ්වාස අතරට ගෙන එනු ලැබුවේ ද බෞද්ධ සාහිත්‍යයෙනි. නිදර්ශනයක් පහත දැක් වේ. "**ඒ දළදා වහන්සේ අහසට පැන නැඟී චොරඳනා නවසඳකලා සෙයින් සියලු සත්‍වයන් සතුටු කරවා ගුවන් කුස බබුළුවමින් පෙළහර දක්වා**" (දළදා සිරිත, සොරත, 1955:24). ආශ්චර්යයන් ප්‍රතික්ෂේප කිරීමට බෞද්ධ සමාජයේ සාමාජිකයින්ට ඉඩක් නො ලැබෙන්නේ මෙබඳු කාරණා හේතුවෙනි. එබඳු සන්දර්භයක් තුළ දේව විශ්වාසයන්ට අවසරයක් ලැබී තිබේ. දෙවියන් පිදීම බොදුනුවන්ගේ ලබ්ධියට විරෝධී නො වන බව පඤ්ඤාමෝලී තිස්ස හිමියෝ **සදාචාර විභාවනියේ**(1904) සඳහන් කරති. පිරිත් සූත්‍රවල ද දෙවියන් පිළිබඳ ව සඳහන්නේ බුදුන් වහන්සේ ද සම්බන්ධ කරමින් අවශේෂ ලෙසිනි. දෙවියන් පිළිබඳ විශ්වාස එසේ බෞද්ධ ඉගැන්වීම් අතරට ප්‍රයුක්ත වී විකාශනයට ලක් වී තිබේ. දේව විශ්වාස ප්‍රමුඛ කරගත් පානම ජනයා නිසි කල එළඹෙනතුරු බෞද්ධ බව සඟවා ගෙන සිටීමට මේ ඉගැන්වීම් පිටිබලක් වී තිබේ. පානමට ආ ජනයාට ආගම ඇදහීමට වඩා වැදගත් වූයේ ආරක්ෂාව යි. ඔවුහු ආරක්ෂාව වෙනුවෙන් ආගම සඟවා ගත්හ. ඒ සම්පූර්ණයෙන් නො වේ. පවත්වා ගෙන ගිය දේව ඇදහිල්ලේ ද බෞද්ධ ලක්ෂණ තිබූ අතර, ආරක්ෂාව තහවුරු වීමෙන් පසු පානම පන්සලක් ඉදි වී බෞද්ධාගම යළි ස්ථාපිත වූ බව තහවුරු විය.

**පර්යේෂණ නිගමන**

තමන් කාලයක් ජීවත් වූ ප්‍රජාවෙන් ඉවත් ව විප්‍රදේශගත ව වෙනත් සංස්කෘතියකින් ආරෝපිත ව සිටිය ද මුලින් පැවැති ඇදහිලි සහමුලින් ම බැහැර නො වේ. වෙනත් ඇදහිල්ලක් කෙරෙහි නැඹුරුවක් දැක් වුව ද මුල් සංස්කෘතියෙන් සම්පූර්ණයෙන් ම බැහැර ව නො සිටින බව නිරීක්ෂණවලින් තහවුරු වේ.

**ප්‍රමුඛ පදඃ** පානම, ඇදහිල්ල, සංස්කෘතිය, පත්තිනි

**මූලාශ්‍රය**


- අදිකාරම්, ඊ.ඩබ්. (2013). **පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය.** දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- අමරසේකර, කේ.ජී. (2013). **සොකරි නාටක පුරාණය.** කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- කාරියවසම්, තිස්ස (1991). **සිරිලක දෙවිවරු.** හියු නෙවිල් කාව්‍යාවලිය ආශ්‍රයෙනි. කොළඹඃ තරංජි ප්‍රින්ටර්ස්.
- කාරියවසම්, තිස්ස (1992). **ශ්‍රී ලංකාවේ දේවතාවියෝ සහ යකින්නියෝ.** කොළඹඃ ගොඩගේ සහෝදරයෝ.
- කිරිබණ්ඩාර, එස්.කේ. (2009). **පනම්පත්තුවේ දේව ඇදහිල්ල.** කර්තෘ ප්‍රකාශනයකි.
- කුරේ, ඇන්.ජේ. (1959). **සොකරි කතාව හෙවත් ගුරු හටන.** කොළඹ.
- කෝපරහේවා, සඳදස්. (2006). **නවගමු දේවාලයේ පත්තිනි ඇදහිල්ල.** කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- ගයිගර්, විල්හෙම්. (1969). **මධ්‍යකාලීන ලංකා සංස්කෘතිය.** (පරි, ඇම්. බී. ආරියපාල). කොළඹඃ ගුණසේන සහ සමාගම.
- ගුණසෝම, ගුණසේකර. **අංකෙළිය-පානම්පත්තුව ඇසරෙන්.** කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- චන්‍ද්‍රජෝති හිමි, මාපොටේගම සහ විපුලසාර හිම, ගොඩගේ (1954). **ලාංකික දෙවිවරු.** ඇහැලියගොඩඃ ගුණතිලක මුද්‍රණාලය.
- දිසානායක, මුදියන්සේ (1988). **කොහොඹා කංකාරිය හා සමාජය.** කැලණිය ශීලා ප්‍රින්ටින් වර්ක්ස්.
- ධම්මරතන හිමි, හිස්සැල්ලේ (1957). **පත්තිනි දෙය්යෝ.** මහරගමඃ සමන් මුද්‍රණාලය.
- ධර්මදාස, කේ.එන්.ඕ. සහ තුන්දෙනිය, එච්.එම්.එස්. (2009). **සිංහල දේව පුරාණය.** කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
- සද්ධාජීව හිමි, පරවාහැර සහ හේවාවසම්, ප.බ.ජී. (සංස්.). (1974). **පන්තිස් කෝල්මුර කවි.** කොළඹඃ ප්‍රදීප ප්‍රකාශකයෝ.
- ලංකානන්ද හිමි, ලබුගම (සංස්.). (1958). **මන්‍දාරම්පුර පුවත.** කොළඹ.
- මාපා, ජේ.පී. (2012). **ලක්දිව අංකෙළිය.** කොළඹඃ සමයර්ධන මුද්‍රණශිල්පියෝ.
- **වයන්තිමාලය** (1925). **කෑගල්ලඃ** විද්‍යාකල්ප ප්‍රෙස්
- වාචිස්සර හිමි, කොටගම (1964). **සරණඞ්කර සඞ්ඝරාජ සමය.** කොළඹඃ වයි. දොන් ඇඩ්වින් සහ සමාගම.
- විජේතුංග, නවනැලියේ (2014). **කිරි අම්මා දානය සහ  පත්තිනි හෑල්ල.** මුල්ලේරියාවඃ දූනුම වැඩුම ප්‍රකාශකයෝ.
- විජේසූරිය, එස්. (1991). **ශ්‍රී ලංකාවේ බෞද්ධ හින්දු සහජීවනය.** කොළඹඃ දීපානී මුද්‍රණාලය.
- සමරණායක, ඩී.ඒ.පී. (1959). **පාලගහෑල්ල හා පත්තිනිහෑල්ල.** කොළඹඃ සී/ස ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.
- හේරත්, සු. බ. (1985). **ගැමි ඇදහිලි හා ආගම්.** මහවැලි වංශය. දෙවන කාණ්ඩය. කොළඹඃ මහවැලි අමාත්‍යාංශය.
- Adikaram, E.W. (1946).  **Early History of Buddhism in Ceylon**. Colombo: M. D. Gunasena.
- Dewaraja, L.S. (1972). **The Kandyan kindom 1707-1760**. Colombo: Lake House Investment.
- Kulatilaka, C, de S. (1984). **Kiri amma Worship and its Ritual Songs**. Samskriti.
- Marasinghe, M.M.J. (1974). **Gods in Early Buddhism.** Kelaniya: Vidyalankara press.
- Obeysekara, Gananath (1963). **“The buddhits Pantheon and its Extensions”**, in Manning Naheed. Athropological  Studies in Theravada Buddhism. New Haven: Yale University Press.
- Obeysekara, Gananath (1984). **The Cult of Goddess Pattini**. The University of Chicago Press.
- Pieris, Paul W. (1950). **Sinhala and the Patriots.** Colombo: Colombo Apothecaries co.
- Ven Rahula, Walpola (1966). **Early Hitory of Buddhistin Ceylon.** Colombo: M. D. Gunasena.
- Wijesekara, Nandadeva (1987). **Deities and Demons Magic and Masks.**  Colombo: M. D. Gunasena.
- Yalman, Nur (1967). **Under the Bo Tree**. California: University of California Press.